**ශීර්ෂය 161 - තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය**

------------------------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය හා භාණ්ඩාගරයේ පොත් සමග සැසඳීමේදී රු.715,538,612 ක වෙනසක් නිරීක්ෂණය විය.

| **විස්තරය** | **මූල්‍ය ප්‍රකාශනයට අනුව වටිනාකම රු.** | **භාණ්ඩාගාර පොත් අනුව වටිනාකම රු.** | **වෙනස රු.** |
|---|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් (ආරම්භක ශේෂය) | 319,866,075 | 225,026,425 | 94,839,650 |
| රථ වාහන මිලදී ගැනීම | 262,929,556 | - | 262,929,556 |
| මූල්‍ය නොවන වත්කම් (අවසාන ශේෂය) | 231,662,632 | 225,026,425 | 6,636,207 |
| වත්කම් අපහරණය | 351,133,199 | - | 351,133,199 |

**නිර්දේශය:** භාණ්ඩාගාර පොත් සමඟ සැසඳීම් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම:** සියලු වත්කම් CIGAS පරිගණක මෘදුකාංගය මඟින් යාවත්කාලීන කිරීමට නොහැකි වී ඇත. අමාත්‍යාංශය යටතට අයත් දෙපාර්තමේන්තු වෙනුවෙන් මිලදී ගෙන ඇත.

| | |
|---|---|
| කිරීම | |
| **එකතුව** | **715,538,612** |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 ජනවාරි සිට වාහන 04 ක් නිෂ්කාර්යව පැවතුණි. | අපහරණය කිරීමට හෝ භාවිතයට සුදුසු තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතුය. | තක්සේරු කමිටුව සඳහා නිලධාරීන් නම් කර එවන ලෙස මෝටර් රථ කොමසාරිස් ජනරාල් වෙත දන්වා යවා ඇත. |
| (ඇ) | ලෝක ආහාර වැඩ සටහන යටතේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබා දී තිබුණු වාහනය 2017 මාර්තු 30 දින අමාත්‍යාංශයට ලබාගෙන තිබුණද පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම වාහනය 2018 ජූලි 06 දින වන විට අස්ථානගතවී තිබුණි. | වගකිවයුතු නිලධාරීන් හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | මූලික විමර්ශන කටයුතු සිදු කර ඇත. |
| (ඈ) | අමාත්‍යාංශයට අයත් නොවන එකතු වටිනාකම රු.22,600,000 ක් වූ වාහන 06 ක් භාවිතයට ගෙන තිබුණද එම වාහන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යවා ඇත. |
| (ඉ) | 2017 හා 2018 වර්ෂවලදී කිලෝමීටර් 54,647 ක් ධාවනය කර තිබූ වාහනයක කලච් පද්ධතිය සිව්වතාවක් අලුතින් සවිකර තිබුණු අතර අලුත්වැඩියාව සඳහා රු.392,709 ක් වැය කර තිබුණි. | අවිධිමත් පරිහරණය වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | පරීක්ෂණයක් පවත්වා වාර්තාවත් ලබාදෙන ලෙස යාන්ත්‍රික ඉංජිනේරුවරයාට දැනුම් දී ඇත. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. **ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |
| ii. **හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. | යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |
| iii. **ලංසු කැඳවීමේ ලේඛනය** | | |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ලංසු කැඳවීමේ ලේඛනයක් පවත්වා ගත යුතුය. | ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. |

**1.6.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | අමාත්‍යාංශයේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අවශ්‍ය ශක්තිමත් කිරීම් සිදු කිරීමට පියවර ගෙන ඇත. |

**1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) මුදල් රෙගුලාසි 104 | - | වාහන අනතුරු 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නොපමාව පරීක්ෂණ සිදු කිරීමට කටයුතු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 1645(ආ) | - | මුදල් රෙගුලාසි 1645(ආ) ප්‍රකාරව දෛනික ධාවන සටහන් සෑම මාසයකම 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, වාහන 14 ක මාස 8 ක ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මාසයක් ඇතුළත ඉදිරිපත් කරමි. |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>**----------------** | | | | |
| | (i) 1992 අගෝස්තු 19 දිනැති අංක 25/99 | - | අමාත්‍යාංශය සතු සංචිත වාහන 16 ක රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මසක් ඇතුළත යෙදීමට කටයුතු කරමි. |
| | (ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 | - | වාහන නඩත්තුව, ඉන්ධන පරිභෝජනය, ලොග් සටහන් හා ධාවන සටහන් පවත්වා ගැනීම හා ඉන්ධන කාර්යක්ෂමතාවය මැන බැලීමකින් තොරව වාහන භාවිතා කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |
| **(ඇ)** | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | වනජීවී භාරය වසා දැමීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණ ද අමාත්‍යාංශය එපරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ .උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වසා දැමීමට කටයුතු කරමි. |
| **(ඈ)** | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛය | - | ධාවනය කළ නොහැකි තත්වයේ පවතින මෝටර් වාහන 2016 ජූනි 30 ට පෙර අපහරණය කළ යුතු වුවද වාහන 03 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | කමිටුවක් පත්කොට තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැය විෂයන් 03 කට අදාළව මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන්වලට ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසුවද රු.1,542,848 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මනා අධ්‍යයනයකින් යුක්තව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | අමාත්‍යාංශ ඒකාබද්ධ වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිව ඇත. |
| (ආ) 2018 වර්ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ සඳහන් වැය විෂයන් 21 ක සියයට 17 සිට සියයට 98 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය වූ අතර එක් වැය විෂයක සියයට සියයම ඉතිරි වී තිබුණි. | මනා අධ්‍යයනයකින් යුක්තව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | අමාත්‍යාංශ ඒකාබද්ධ වීම හේතුවෙන් වියදම් සීමාවීම. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව යම් දෙපාර්තමේන්තුවක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැඳී සිටිය යුතු වුවත් අමාත්‍යාංශය විසින් වැය විෂයන් 02 ක ප්‍රතිපාදන ඉක්මවා රු.2,447,357 ක බැරකම්වලට එළඹී තිබුණි. | මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා දැරූ වියදමක් සහ CITES සමළුව සඳහා දැරූ වියදම් වෙනුවෙන් ඇති වූ බැඳීමකි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ අවසන් විය යුතු උතුරු පළාත් සංවර්ධන සැලැස්ම හා පුත්තලම් දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම සඳහා පිළිවෙලින් රු.මිලියන 10 ක් හා රු.මිලියන 11.5 ක් වෙන්කර තිබුණද, වැය කරන ලද රු.මිලියන 0.67 ක් හා රු.මිලියන 5.2 කට අදාළ කාර්යයන්වල භෞතික ප්‍රගතිය සියයට 25 ක හා සියයට 40 ක පමණ අඩු මට්ටමක පැවතුණි. | සැලසුම් කරන ලද ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. | 2018 වර්ෂයේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර උතුරු පළාතේ පිහිටි වනජීවී පාරිසරික සංචාරක විභවතාවයක් සහිත රක්ෂිත ප්‍රදේශ අධ්‍යයනය කිරීමට මිල ගණන් කැඳවා ඇති අතර කිසිවෙක් ඉදිරිපත් වී නැත. සැලසුම් කර තිබූ ව්‍යාපෘති වල ප්‍රතිපාදන වෙනත් වැය විෂයකට මාරු කිරීමට තීරණය කරන ලදී. |

**3.2** **කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 පෙබරවාරි 01 දිනැති අංක අමප/16/26/98/708/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නව අභය භූමි ප්‍රකාශයට පත් කිරීම, ජාතික අභය භූමි තත්ත්වයට උසස් කිරීම, ස්වභාවික රක්ෂිතයක් බවට පත් කිරීම හා අභය භූමි මායිම් සංශෝධනය සිදු කළ යුතු වුවද කලාවැව ජාතික උද්‍යානය, කායන්කරණීය සමුද්‍රීය නව ස්වභාවික රක්ෂිතය, කුඩා රාවණා මහා රාවණා හා සමුද්‍රීය අභය භූමිය ප්‍රකාශයට පත් කිරීම, මාදුගඟ අභය භූමියේ මායිම් සංශෝධනය කිරීමේ කටයුතු 2018 අවසානය වන විටත් සිදුකර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. | අවශ්‍ය නීතිමය කටයුතු කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) තිරසර සංවර්ධන අභිමතාර්ථ 17 සහ ඊට අනුබද්ධ ඉලක්ක 169 කින් සමන්විත මෙම ජාතික මට්ටමේ වැඩ සටහන 2030 වන විට අවසන් කිරීමට නියමිත වුවත් මෙම කාල පරිච්ඡේදය ආවරණය කරමින් අදාළ අභිමතාර්ථ ළඟාකර ගැනීමට හැකිවන අයුරින් සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් පිළියෙල කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම පිළියෙල කර ඒ අනුව අභිමතාර්ථ ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2018 වර්ෂයේ තිරසර සංවර්ධන අංශයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් වේ. |
| (ආ) අභිමතාර්ථ ළඟා කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශයට පැවරී තිබූ නමුත් අදාළ ආයතනවල තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට ක්‍රියාමාර්ග 2019 අප්‍රේල් 30 දින තෙක් ගෙන නොතිබුණි. | රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය සිදුකළ යුතුය. | දැනට මෙම කටයුතු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ඇති තිරසර සංවර්ධන සභාව විසින් සිදු කිරීමට නියමිතය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක හා ද්විතීක මට්ටමේ තනතුරු 09 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් අමාත්‍යාංශයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය අවම මට්ටමක පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කඩිනමින් පියවර ගත යුතුය. | අදාළ පුරප්පාඩු සඳහා නිලධාරීන් පත්කර එවන ලෙසට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇත. |
| (ආ) සමස්තයක් ලෙස අමාත්‍යාංශයේ පුරප්පාඩු තනතුරු 27 ක් පවතින අතර එම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා යවා ඇති පුරප්පාඩු සඳහා නිලධාරීන් |

බඳවා ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇත.